කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2014

2018 අගෝස්තු/සැප්තැම්බර්/ඔක්තෝබර්

මානවශාස්ත්‍ර පීඨය

බෞද්ධ දර්ශනය

**භාරතීය දාර්ශනික පසුබිම හා බෞද්ධ දර්ශනයේ මූලධර්ම BUPH E - 1015**

**ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

1. ඉන්දු - නිම්න ශිෂ්ටාචාරයේ පැවැති සරල ආගමික ඉගැන්වීම්වල බලපෑම පශ්චාද් භාරතීය දර්ශනයට පසුබිම් වූ අයුරු පැහැදැලි කරන්න.

2. වෛදිකයන්ගේ සාම්ප්‍රදායික බහුදේවවාදී සංකල්පය අනුක්‍රමයෙන් අදේවවාදයක් දක්වා පරිවර්තනය වීමට බලපෑ හේතු සාධක ඉදිරිපත් කරන්න.

3. බ්‍රාහ්මණ සම්ප්‍රදායයෙහි දැක්වෙන යාග කර්ම පිළිබඳ කෙටියෙන් හඳුන්වා එමගින් අපේක්ෂිත ලෞකික අරමුණු විස්තර කරන්න.

4. භාරතීය සාමයික පසුබිමෙහි ආරණ්‍යක යුගය නියෝජනය කරනු ලබන සුවිශේෂතා එහි සාහිත්‍ය ඇසුරින් විශද කරන්න.

5. " ආත්මානං විද්ධි: " මෙම ප්‍රකාශය පදනම් කොටගෙන උපනිෂද් චින්තනය පිළිබඳ විවරණයක් සපයන්න.

6. මක්ඛලී ගෝසාල තුමාගේ නියතිවාදී ඉගැන්වීම පුද්ගල ශක්‍යතාව කෙරෙහි සිදුකරනු ලබන බලපෑම විස්තර කරන්න.

7. විශ්වයේ යථාර්ථය තේරුම් ගැනීම සඳහා අනිත්‍යතා සිද්ධාන්තය උපයෝගී කරගතහැකි අයුරු පරීක්ෂා කරන්න.

8. ප්‍රතීත්‍යසමුත්පාද න්‍යායෙහි මූලික අරමුණ පැහැදිලි කරමින් සමාජගත ගැටලු නිරාකරණයෙහි ලා එම ඉගැන්වීම කෙසේ භාවිතා කළ හැකිදැයි සෝදාහරණව ප්‍රකට කරන්න.

9. දුක්ඛනිරෝධගාමිණී පටිපදා ආර්ය සත්‍යය මගින් පිළිබිඹු කෙරෙන ලෞකික අර්ථ සිද්ධිය විග්‍රහ කරන්න.

10. කර්මය හා ඵලය පිළිබඳ බෞද්ධ විග්‍රහයෙන් අහේතුවාදී සහ නියතිවාදී ස්ථාවරයක් අර්ථවත් නොවන බව සනාථ කරන්න.

*********************